# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012**
**2014 අප්‍රේල්/මැයි/ජූනි**

**සමාජීයවිද්‍යා පීඨය**

**ආර්ථික විද්‍යාව - ECON E3015**

**සාර්ව ආර්ථික විද්‍යාව**

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අර්ථක්‍රමයක මූලික සාර්ව ආර්ථික අරමුණු මොනවාදැයි විස්තර කොට එහිදී ඇතැම් සාර්ව ආර්ථික අරමුණු අතර මතුවිය හැකි ගැටුම් මොනවාදැයි පැහැදිලි කරන්න.

02. (අ) "උද්ධමනයට මූලික වශයෙන් හේතු වන්නේ පිරිවැය තෙරපුම් කම්පනයි" මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

(ආ) කෙටි කාලීනව සහ දිගු කාලීනව සේවා වියුක්තිය සහ උද්ධමනය අතර පවත්නා අන්‍යෝන්‍ය සම්බන්ධතාව කෙසේද?

03. "උද්ධමන පරතරය" මගින් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කොට රජය සහ මහ බැංකුව එවැනි පරතරයක් අඩු කිරීමට කටයුතු කරන්නේ මන්දැයි මෙන්ම කෙසේදැයි පැහැදිලි කරන්න.

04. එක්තරා කල්පිත අර්ථක්‍රමයක සාර්ව ආර්ථික දත්ත සමූහයක් පහත වගුව මගින් සාරාංශ කොට දක්වා ඇත (සියලුම අගයන් රුපියල් දශ ලක්ෂ වලිනි).

| Y | C | r% | I | $L_1$ | $L_2$ |
|---|---|---|---|---|---|
| 2000 | 1800 | 10 | 500 | 500 | 500 |
| 3000 | 2600 | 12 | 400 | 800 | 400 |

සහ $Ms = 1000$

ඉහත දී ඇති දත්ත භාවිතයෙන්

(අ) සමතුලිත ජාතික ආදායම් මට්ටම සොයන්න.
(ආ) සමතුලිත පොලී අනුපාතිකය තීරණය කරන්න.
(ඉ) තුලන අයවැය ගුණකය යන්නනේ අදහස් වන්නේ කුමක්ද?

05. (අ) "මූල්‍ය ප්‍රතිපත්තිය"නිර්වචනය කර මූල්‍ය ප්‍රතිපත්තියේ සාම්ප්‍රදායික උපකරණ විස්තර කරන්න.

(ආ) සමාහාර සැපයුම් කම්පන සමනය කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපත්ති අසමත් වන්නේ මන්ද?

(ඉ) "පිස්කල් ප්‍රතිපත්තිය" මගින් අදහස් වන්නේ කුමක්ද?

06. ජාතික ආර්ථික සංවර්ධනයේ දී ජාත්‍යන්තර වෙළෙඳාම වාසිදායක වන්නේ කෙසේදැයි පැහැදිලි කොට එවැනි සංදර්භයක් තුළ රටකට මුහුණ පෑමට සිදුවන ප්‍රධාන දුෂ්කරතා සහ ගැටලු පිළිබඳ අදහස් දක්වන්න.

07. (අ) "ආර්ථික වර්ධනය " නිර්වචනය කොට ආර්ථික වර්ධනය මනිනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ආ) ආර්ථික වර්ධන මැනීම කෙරෙහි ආර්ථික විද්‍යාඥයින් උනන්දු වන්නේ මන්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ඉ) ආර්ථික වර්ධනය නිර්ණය කෙරෙන සාධක මොනවාදැයි විස්තර කරන්න.

(ඊ) වේගවත් ආර්ථික වර්ධනයක් හා බැඳුණු වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

08. (අ) රාජ්‍ය ණය සහ අයවැය හිඟය අතර පවත්නා සම්බන්ධතාව පිළිබඳව සාකච්ඡා කරන්න.

(ආ) ඇතැම් රටවල රාජ්‍ය ණය සීඝ්‍රයෙන් වර්ධනය වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

09. පහත දැක්වෙන හතරක් (04) පිළිබඳ සටහන් ලියන්න.

(අ) ආන්තික පාරිභෝජන නැඹියාව

(ආ) ද්‍රවශීලතා පාශය

(ඉ) සමහාර ඉල්ලුම

(ඊ) ප්‍රාග්ධනයේ ආන්තික කාර්යක්ෂමතාව

(උ) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය

(ඌ) ව්‍යුහගත සේවාවියුක්තිය

*****************************